# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 6 ශ්‍රේණිය

## නර්තනය

**කාලය : පැ $1\frac{1}{2}$**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) නර්තනයේ මූලික ඉරියව්ව වන්නේ

i) නමස්කාරය  
ii) මණ්ඩිය  
iii) හමාර පදය  
iv) පා සරඹ

(2) කාන්තාවන්ට වඩාත් උචිත ගැමි නැටුමක් වන්නේ,

i) කළගෙඩි නැටුම  
ii) ලී කෙළි නැටුම  
iii) තාලම් නැටුම  
iv) පතුරු නැටුම

(3) ශ්‍රී ලාංකික බෞද්ධ ජනයා උත්කර්ෂවත් ලෙස පවත්වන ආගමික උත්සවයකි

i) පොසොන් උත්සවය  
ii) ඇසළ උත්සවය  
iii) වෙසක් උත්ස්වය  
iv) රාමසාන් උත්සවය

(4) උඩරට පා සරඹ අතුරින් දෙවන පා සරඹය හඳුන්වන නාමය වන්නේ,

i) අඩිය  
ii) දෙපැති අඩිය  
iii) තුන් අඩිය  
iv) දැඩිය

(5) සබරගමු සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,

i) ගැට බෙරය  
ii) තම්මැට්ටම  
iii) දවුල  
iv) උඩැක්කිය

- **සුදුසු පිළිතුර යාකරන්න.**

| | |
|---|---|
| (6) හින්දු ජනයා ජනවාරි මස පවත්වන උත්සවයකි | ගොප් කොළ නලාව |
| (7) උඩරට පා සරඹ හඳුන්වන තවත් නමකි | නමස්කාර සරඹය |
| (8) විකල්ප වාද්‍ය භාණ්ඩ උපකරණයක්වේ | දණ්ඩියමේ සරඹ |
| (9) ද්‍රවිඩ ගැමි නැටුමකි | තෛපොංගල් |
| (10) නර්තනයේ ආශිර්වාදය ලබා ගැනීම සඳහා ආරම්භයේදී සිදු කරයි | කෝලාට්ටම් |

- **11 - 15 දක්වා දී ඇති වාක්‍ය හරි නම් (√ ) ලකුණ ද වැරදි නම් (×) ලකුණ දවාක්‍ය අවසානයේ දී ඇති වරහන තුළ යොදන්න.**

(11) "බෝ අත්තට වැඳ සිරස නමන්නේ " යන කවිය කළගෙඩි කවියකි. ( )

(12) අතීතයේ නර්තන අධ්‍යාපනයට පිවිසියේ ගුරු ගෙදරිනි. ( )

(13) උඩරට පා සරඹ අවසන් කිරීමට හමාර පදය යොදාගනී ( )

(14) උඩරට නර්තන සම්ප්‍රදායේ වාද්‍ය භාණ්ඩය දවුලයි ( )

(15) දේශීය නර්තන සම්ප්‍රදායන් ගණනින් 04 කි ( )

- **16 - 20 දක්වා දී ඇති ප්‍රශ්න වලට හිස්තැන් පුරවන්න.**

(16) ස්වභාවික පරිසරය තුළ ............................................ සෞන්දර්යාත්මක ලක්ෂණවලින් අනූනය.

ඇළ / දොළ / මුහුද

(17) සත්ව චරිත පමණක් නොව ...................................... චරිත ද පරිසරයේ දැකිය හැකිය.

සත්ත්ව / මිනිස් / අශ්ව

(18) සිතේ ඇතිවන සතුට නිරූපනය වන්නේ .......................................... හා ශරීරයේ විවිධ ඉරියව් මගිනි.

මුහුණ / කට / සිත

(19) ගැමි නැටුම් සඳහා ........................................... චලන භාවිතා කරයි.

සංකීර්ණ / සරල / ඒකීය

(20) ලී කෙළි නැටුම ........................................... නැටුමකි.

ඒකල / සාමූහික / විශේෂ

(ල. 1x20 )

**11 කොටස**

- **පලමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

(1)

i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් තුන නම් කරන්න.
ii) එම සම්ප්‍රදායන් පවතින ප්‍රදේශ එක බැගින් ලියන්න.
iii) දේශීය නර්තන සම්ප්‍රධායන්හි ප්‍රධාන වාද්‍ය භාණ්ඩ තුන නම් කරන්න.
iv) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලය නම් කරන්න.
v) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට අයත් ශාන්ති කර්ම තුනෙහි නම් ලියන්න. ( ල. 2 × 5)

(2) දවුල - ගැට බෙරය - දඬු බෙරය - තම්මැට්ටම - ගොප්කොළ නලාව - ටින් බෙරය - යක් බෙරය - ටොනික් පියන් වලල්ල - පොල්කටු තාලම්පොට - රබාන

i) ඉහත දැක්වෙන භාණ්ඩ සම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය භාණ්ඩ වශයෙන් වෙන් කොට ලියා දක්වන්න. (ල.5)
ii) විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් සොයා ගතහැකි ද්‍රව්‍ය 05 ක් නම් කරන්න. (ල.5)

(3)

i) බෞද්ධ ජනයාට වෙසක් උත්සවය වැදගත් වන්නේ කුමන හේතුවක් නිසාද? (ල.2)
ii) වෙසක් උත්සවයකදී දක්නට ලැබෙන සැරසිලි 02 ක් ලියා දක්වන්න. (ල.4)
iii) වෙසක් උත්සවය හා සබැඳි සාර ධර්ම දෙකක් ලියන්න. (ල.4)

(4)

i) ඔබ ඉගෙනගත් සිංහල ගැමි නැටුම්වලට සමාන ද්‍රවිඩ නැටුම් 02 ක් ලියන්න. (ල.3)
ii) කාන්තාවන්ට උචිත සිංහල ගැමි නැටුමක් නම් කරන්න. (ල.3)
iii) එම නැටුමට අදාළ කවියක් ලියන්න. (ල.4)